# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2023 (2024)
# කතෝලික ධර්මය 1
# ප්‍රශ්න

---

1. ''එතුමා ඉතිහාසඥයෙකි, චිත්‍ර ශිල්පියෙකි, එමෙන්ම වෛද්‍යවරයෙකි.'' මෙලෙස හඳුන්වනු ලැබුයේ,
   (1) ශුද්ධ වූ මාක් තුමා ය. (2) ශුද්ධ වූ මතෙව් තුමා ය.
   (3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ශුද්ධ වූ ජොහාන් තුමා ය.

2. නව ගිවිසුමේ වැඩිම පොත් සංඛ්‍යාවක් ලියන ලද්දේ,
   (1) ශුද්ධ වූ මතෙව් තුමා විසිනි. (2) ශුද්ධ වූ ජොහන් තුමා විසිනි.
   (3) ශුද්ධ වූ ජාකොබ් තුමා විසිනි. (4) ශුද්ධ වූ පාවුලු තුමා විසිනි.

3. ''මා නුඹට දිය යුතු දෙය ඉල්ලන්න'' යනුවෙන් සමිඳාණෝ සලමොන් රජතුමාට පැවසුයේ කුමන ස්ථානයේ දී ද?
   (1) ගිබියොන්හි දී (2) බෙතෙල් හි දී (3) අම්මොන්හි දී (4) ජෙරිකෝහි දී

4. ජුදයින් අතට පාවා දීමෙන් අනතුරුව ජේසුස් වහන්සේව පළමුව රැගෙන ගියේ,
   (1) පිලාත් ඉදිරියට ය. (2) ප්‍රෙතෝරියම් වෙතට ය.
   (3) හෙරෝද් ඉදිරියට ය. (4) උත්තම පූජකයාගේ මැඳුර වෙතට ය.

5. 'පෙන්තකොස්ත' යන්නෙහි අර්ථය,
   (1) තිහ යන්න ය. (2) තිස්තුන යන්න ය.
   (3) හතළිහ යන්න ය. (4) පනහ යන්න ය.

6. ශුද්ධ වූ ස්තෙපන් තුමාට ගල් ගසා මරා දැමූ විට සතුටු වූයේ,
   (1) සාවුල් තුමා ය. (2) පිලිප් තුමා ය.
   (3) ජාකොබ් තුමා ය. (4) කොර්නේලියස් තුමා ය.

7. ''බිය නොවන්න. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත.'' ජේසුස් වහන්සේ මෙසේ පැවසූයේ,
   (1) ශුද්ධ වූ ජොහාන් තුමාට ය. (2) ශුද්ධ වූ පේදුරු තුමාට ය.
   (3) ශුද්ධ වූ ඇන්ඩෘ තුමාට ය. (4) ශුද්ධ වූ ජාකොබ් තුමාට ය.

8. විශ්වීය සභාව එක ජාතියකට එක දේශයකට නොහොත් එක් ප්‍රදේශයකට සීමා වී නැති නිසා එය විස්තර කරනුයේ,
   (1) ඒකීය ලෙස ය. (2) ශුද්ධ වූ ලෙස ය.
   (3) කතෝලික ලෙස ය. (4) අපෝස්තලික ලෙස ය.

9. දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය ලෙස හඳුන්වනු ලබන්නේ,
   (1) සමගි සන්ධානය ය. (2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය.
   (3) පූජකවරය ය. (4) ආශිර්වාදකාර බන්ධනය ය.

10. ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගේ පාද දෝවනය කිරීමේ සිද්ධිය සඳහන් කරන සුවිශේෂකවරයා වන්නේ,

(1) ශුද්ධ වූ ජොහන් තුමා ය. (2) ශුද්ධ වූ ලූක් තුමා ය.
(3) ශුද්ධ වූ මතෙව් තුමා ය. (4) ශුද්ධ වූ මාක් තුමා ය.

11. අත්‍යන්ත වූ ද අපරිමිත වූ ද සදාතනික වූ ද යාගය,
(1) ධාන්‍ය පූජාව යි. (2) සහභාගිකමේ පූජාව යි.
(3) කල්වාරි යාගය යි. (4) මෙල්කිසදෙක් ගේ යාගය යි.

12. ආගම් වෙනස්කම් නොතකා ජුදා සිනගෝගයකට හා මුස්ලිම් පල්ලියකට වැඩම කළ පළමු අති උතුම් ශුද්ධෝත්තම පියතුමා වූයේ,
(1) පළමුවන ජුවාම් පාවුලු ය. (2) දෙවන ජුවාම් පාවුලු ය.
(3) අටවන පියුස් ය. (4) නවවන පියුස් ය.

13. ''එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක.'' යනුවෙන් පවසන ලද්දේ,
(1) මරිය තුමිය විසිනි. (2) එළිසබෙත් තුමිය විසිනි.
(3) මරිය මග්දලේනා තුමිය විසිනි. (4) වෙරෝනිකා තුමිය විසිනි.

14. පරිසරය විනාශ කිරීම කුමන පනතට විරුද්ධ පාපයක් ද?
(1) පළමු පනතට. (2) දෙවන පනතට.
(3) සිව්වන පනතට. (4) පස්වන පනතට.

15. පොතිපර්ගේ බිරිඳ කළ පෙළඹීමට ජෝශප් එකඟ වූයේ නම්, කඩවනුයේ,
(1) සිව්වන පනතට යි. (2) පස්වන පනතට යි.
(3) සයවන පනතට යි. (4) හත්වන පනතට යි.

16. අනුන්ගේ දේපළ පැහැර නොගන්නටත්, සාධාරණ ණය ගෙවන්නටත් උපදෙස් දෙන දේව පනත් වන්නේ,
(1) පහ සහ හත ය. (2) හය සහ නවය ය.
(3) හත සහ දහය ය. (4) අට සහ දහය ය.

17. 'දෙවියන් වහන්සේට බොරු කළ අයට භයානක විනිශ්චයක් පැමිණෙන්නේ ය' යන්න පෙන්වා දෙන්නේ,
(1) දාවිත් හා ගොලියත් සිද්ධියෙනි. (2) අනනියස් හා සපිරා සිද්ධියෙනි.
(3) පේදුරු හා පාවුලු සිද්ධියෙනි. (4) පේදුරු හා කොර්නේලයස් සිද්ධියෙනි.

18. ජනවන්දනා වසරේ පාස්කු සමයට පෙර ඇති සමය,
(1) ආගමන සමය යි. (2) චතාරික සමය යි.
(3) නත්තල් සමය යි. (4) සාමාන්‍ය සමය II අදියරයි.

19. දිව්‍ය පූජාව ආරම්භක පිළිවෙතට අයත් කොටසක් වන්නේ,
(1) පළමු දේව ප්‍රකාශනයයි. (2) සාධුකාරය හෙවත් සුපුවත් ජය නදයි.
(3) ධර්මානුශාසනාව යි. (4) සුරදූත ගීයයි.

20. 'ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකටම යාච්ඤාවෙන් සූදානම් විය යුතු ය.' යන්න පෙන්වා

දෙන්නේ,

(1) යාම යැදුම මඟිනි. (2) උත්තම පූජක යාච්ඤාව මඟිනි.
(3) මල් උයනේ යාච්ඤාව මඟිනි. (4) ස්වාමිවාක් ආරාධනාව මඟිනි.

21. ප්‍රධාන දිවැසිවරයෙකි. සුළු දිවැසිවරයෙකි. දේශක දිවැසිවරයෙකි. මෙම එක් එක් කාණ්ඩයට අයත් දිවැසිවරයා බැගින් පිළිවෙළින් සඳහන් වන වරණය තෝරන්න.

(1) එසකියෙල්, එලීෂා, හොසියා (2) යෙසායා, ආමොස්, එලියා
(3) ආමොස්, එලියා, නාතාන්. (4) ජෙරමියා, නාතාන්, මීකා

22. 'මනුෂ්‍ය පුත්‍රය, මේ පොත අනුභව කර ගොස් ඊශ්‍රායෙල් වංශයට කතා කරන්න' යැයි වදාළේ,

(1) යෙසායා දිවැසිවරයාට ය. (2) ජෙරමියා දිවැසිවරයාට ය.
(3) එසකියෙල් දිවැසිවරයාට ය. (4) ජෝනා දිවැසිවරයාට ය.

23. ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බවත්, ඔවුන් වහන්සේ ඇදහීමෙන් සදාතන ජීවිතය ලැබෙන බවත් සඳහන් කරන සුබාරංචි කතුවරයා වන්නේ,

(1) ශුද්ධ වූ මාක් තුමා ය. (2) ශුද්ධ වූ මතෙව් තුමා ය.
(3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ශුද්ධ වූ ජොහන් තුමා ය.

24. ස්ත්‍රිය පුරුෂයාගේ ඉල ඇටයකින් මැවීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(1) ස්ත්‍රිය පුරුෂයාගේ වහලියක් පාලිකාවක් නොව ඔහුට සහයවන්නියක් බව යි.
(2) ඉල ඇටය හදවතට සමීප නිසා ප්‍රේමයෙන් හා එකමුතුකමින් ජීවත් විය යුතු ය.
(3) ස්ත්‍රිය හා පුරුෂයා යන දෙදෙනාම දේව මැවිලි බව යි.
(4) මිනිස් ගරුත්වය රැකෙන පරිදි ස්ත්‍රිය හා පුරුෂයා වෙනස්කම්වලට ගරු කළ යුතු බව ය.

25. පහත සඳහන් ප්‍රකාශ කෙරේ අවධානය යොමු කරන්න.

A – ''මෙතැන් සිට නුඹ වගා කරන විට එය නුඹට එලදාව නොදෙන්නේ ය.''
B – ''දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නෙහි ය.''
C – ''නුඹ මිහිපිට ඉබාගාතේ යන මිනිසෙකු වන්නෙහි ය.''
D – ''පොළවෙන් නුඹට කටු පඳුරු ද වල් පැලෑටි ද උපදන්නේ ය.''

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් දෙවියන් වහන්සේ කායින්ට දුන් දඬුවම් සඳහන් වන පිළිතුර වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) B හා D ය.

26. තුන් වෙනි, පස්වෙනි සහ හත්වෙනි වසංගත වනුයේ අනුපිළිවෙළින්,

(1) කිනිතුළු උවදුර, ගඩු උවදුර හා පළඟැටි උවදුර ය.
(2) මැසි උවදුර, ගව සම්පත් වැනසීම හා ගනඳුරු උවදුර ය.
(3) කිනිතුළු උවදුර, ගව සම්පත් වැනසීම හා ගල් වර්ෂා උවදුර ය.
(4) ගව සම්පත් වැනසීම, ගල් වර්ෂා උවදුර හා පළඟැටි උවදුර ය.

27. ''ඔහු ස්වාමීන් වහන්සේ අභිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය. ඔහු මිදි යුෂවත් මත්පැන්වත්

නොබොන්නේ ය'' ලූක් සුබාරංචියේ මෙසේ සඳහන් කරන්නේ,

(1) මෝසෙස් තුමා පිළිබඳව ය. (2) ආබ්‍රහම් තුමා පිළිබඳව ය.

(3) ජාකොබ් තුමා පිළිබඳව ය. (4) ස්නාවක ජොහන් තුමා පිළිබඳව ය.

28. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් උපමා මගින් ඉගැන් වූ බව තහවුරු කරන උදාහරණයන් වන්නේ,

(1) කිරිඳි පිළිබඳ උපමාවයි. (2) නැතිවුන බැටළුවා පිළිබඳ උපමාවයි.

(3) රන් කාසි දහය පිළිබඳ උපමාවයි. (4) යහපත් සමාරියා පිළිබඳ උපමාවයි.

29. 'නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු,

(1) දෙවියන් වහන්සේ දකින්නෝ ය.''

(2) දේශය උරුම කරගන්නෝ ය.''

(3) දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝ ය.''

(4) ස්වර්ග රාජ්‍යය උරුම කර ගන්නෝ ය.''

30. සැබෑ සිත් හැරීමකින් හා පසුතැවීමකින් යුතුව සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබාගන්නා,

(1) වස්ත්‍ර නැති වූවන්ට වස්ත්‍ර දෙයි. (2) පාපයන්ට නොවැටී ජීවත් වෙයි.

(3) වත නොව සිත ඉරා ගනියි. (4) තමන්ට වරද කළ අයට සමාව දෙයි

31. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය තුළින්,

(1) ආත්මයෙහි නොමැකෙන ලාංඡනයක් සනිටුහන් කරයි.

(2) බිඳ වැටුණු සබඳතා නැවත ගොඩ නැඟෙයි.

(3) නිල පූජකවරයේ පංගුකාරිත්වය ලැබේ.

(4) ධර්මදූත මෙහෙවරක් පැවරෙයි.

32. 'විවාහ ගිවිසුම' අවලංගු කළ නොහැකි දේව ප්‍රසාද නිධානයක් වන අතර, ඒ සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසියක් වන්නේ,

(1) දෙමාපියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමය යි.

(2) විවාහ පොරොන්දුව ශබ්ද නඟා පැවසීම යි.

(3) ප්‍රසාද ස්නාපනය ලැබූ දෙදෙනෙකු වීම යි.

(4) යුවලගේ සාක්ෂිකරුවන් ඉදිරියේ සිදුවීම යි.

33. ආරණ්‍යවාසී තාපසයන් අතර පළමුවැන්නා වන්නේ,

(1) බෙනඩික් තුමා ය. (2) තිබ්ස් හි පාවුලු තුමා ය.

(3) අගුස්තීනු තුමා ය. (4) අම්බ්‍රෝස් තුමා ය.

34. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව පූජක, පැවිදි, ගිහි සැමගේ දිවැසිවර කර්යයෙහි ප්‍රධාන දූත සේවාව වන්නේ,

(1) ධර්මදානය යි. (2) ආකල්ප වර්ධනය කිරීම යි.

(3) සැමටම ප්‍රේම කිරීම යි. (4) එඬේරික කාර්යය යි.

35. අති උතුම් ලියෝ ජෝශප් කාදිනල් කාඩයින් හිම්පාණන් විසින් ආරම්භ කරන ලද්දේ,

(1) ධර්මදූත ළමා සමාජය යි.

(2) කිතුදන පුබුදුව යි.

(3) මරිය හමුදාව යි.
(4) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය යි.

36. ජේසුස් වහන්සේ තම ගෝලයින්ට ඉගැන්වූ යාච්ඤාව වාර්තා කර ඇති සුබාරංචි දෙක වන්නේ,
(1) මාක් හා මතෙව් සුබාරංචි ය. (2) මාක් හා ලූක් සුබාරංචි ය.
(3) ලූක් හා ජොහන් සුබාරංචි ය. (4) ලූක් හා මතෙව් සුබාරංචි ය.

37. ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීමට පෙර අප විසින් කළ යුත්තේ කුමක් ද?
(1) දෑත් ඉහළට එසවීම.
(2) අපට වරද කළ සැමට සමාව දීම
(3) එදිනෙදා භෝජනය අපට නිරතුරු ලබා දෙන බව විශ්වාස කිරීම.
(4) දෙවියන්ගේ ශ්‍රී නාමයට නමස්කාර කිරීම.

38. මරිය තුමිය ඉල්ලා සිටි පරිදි අපගේ සිත් හැරීම් සඳහාත්, දෙවනුව අන් අයගේ සිත් හැරීම සඳහාත් කළ යුත්තේ කුමක් ද?
(1) සැබෑ මනස්ථාපනයක් ඇති කර ගැනීම.
(2) සමඟි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ගැනීම
(3) දිනපතා ජපමාලය යැදීම.
(4) දිව්‍ය සත්ප්‍රසාද යැදුම් මෙහෙයට සහභාගි වීම.

39. රාත්‍රී යාම යැදුමේ දී ගායනා කරනු ලබන ප්‍රශංසා ගීය,
(1) සෙකරියස් තුමාගේ ය. (2) මරිය තුමියගේ ය.
(3) මෝසෙස් තුමාගේ ය. (4) සිමියොන් තුමාගේ ය.

40. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව භාවනාව යනු සොයා යාමකි. එහි දී විමසිලිමත් විය යුතු කරුණු **දෙක** ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
A – භාවනාවේ ජීවිතය සඳහා පතපොත උපයෝගී කර ගැනීම.
B – කිතුනු ජීවිතයේ පරමාර්ථය
C – කිතුනු ජීවිතය ගත කළ යුතු ආකාරය
D – මූලාශ්‍ර වශයෙන් ශුද්ධ ලියවිල්ල මෙනෙහි කරීම

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

## II **වන පත්‍රය**

1. (i) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) පෙන්තකොස්ත දිනයේ දී ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් තුළ ඇති වූ ප්‍රබල වෙනස්කම් **දෙකක්** ලියන්න.

(iii) ශුද්ධ වූ පාවුලු තුමා තම දෙවන ධර්මදූත ගමනේ දී දේශනා කළ නගර **දෙකක්** නම් කරන්න.

(iv) ශුද්ධ වූ සභාව ශුද්ධ වූ ත්‍රිත්වයට සම්බන්ධ වන ආකාරය කරුණු **දෙකකින්** දක්වන්න.

(v) දෙවියන් වහන්සේ විසින් තම ස්වරූපය හා සමානත්වය අනුව මිනිසා මවා ඔවුනට ආසිරි පතමින් කළ ප්‍රකාශයේ අඩංගු කරුණු **දෙකක්** ලියන්න.

(vi) ඊශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසර රජතුමා අනුගමනය කළ පියවර **දෙකක්** ලියන්න.

(vii) ජේසුස් වහන්සේගේ බෞතීස්ම අවස්ථාවේ දී අහසින් නික්මුණ හඬින් ප්‍රකාශ වූයේ කුමක් ද?

(viii) කිතුනු විවාහයේ පරමාර්ථයන් වන අන්‍යෝන්‍ය සහයෝගය හා ප්‍රේමය තුළ පරිපූර්ණත්වයට පත්වීම සම්බන්ධ කරුණු **දෙකක්** ලියා දක්වන්න.

(ix) කිසියම් පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික යහපත සඳහා කළ හැකි පුණ්‍ය ක්‍රියා **දෙකක්** ලියන්න.

(x) ශුද්ධ වූ මතෙව් සුබාරංචියට අනුව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල අඩංගු සාමය ගොඩනැගීමට අවශ්‍ය කරුණු **දෙකක්** ලියන්න.

2. (i) ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ දී එම ප්‍රදේශවල ජීවත් වූ කතෝලිකයන්ට එල්ල වූ බාධා **දෙකක්** ලියන්න.

(ii) බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරටට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකාය **තුනක්** නම් කරන්න.

(iii) පාසල් සිසුන් අතර සුබාරංචිය පතළ කිරීමට ඔබට දායක විය හැකි ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

3. (i) දරුවන් කෙරෙහි දෙමව්පියන්ගේ යුතුකම් **දෙකක්** ලියන්න.

(ii) දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ යුතුකම් **තුනක්** ලියන්න.

(iii) මිතුරන් වෙනුවෙන් ඔබේ යුතුකම් ඉටු කළ අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

4. (i) 'ලිටුර්ජියා' (ජන වන්දනා) යන ග්‍රීක වචනය සෑදී ඇති 'ලාඕස්' සහ 'එර්ගොන්' යන වචන **දෙකකෙහි** අර්ථය ලියන්න.

(ii) චතාරික සමය අර්ථකථනය කරන ආකාර **තුනක්** ලියන්න.

(iii) පාසල් සිසුවෙකු වශයෙන් ඔබ මීසම තුළ චතාරික සමය අර්ථවත් කර ගැනීමට ඔබට කළ හැකි දෑ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

5. (i) ජේසුස් වහන්සේගේ දූත සේවාවේ දී රෝගීන් සුවපත් කළ අවස්ථා **දෙකක්** නම් කරන්න.

(ii) රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද **තුනක්** ලියන්න.

(iii) රෝගී තත්ත්වයෙන් සමාජයේ අසරණව සිටින අය වෙනුවෙන් ඔබට කළ හැකි යහපත් ක්‍රියා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

6. (i) දෙවන මැවීමේ කථාවේ දී දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් සඳහා යොදා ඇති හෙබ්‍රෙව් වචන සහ ඒවාහි අර්ථයන් ලියා දක්වන්න.

(ii) ඇතුළාන්ත සාමයට මූලික වන කරුණු **තුනක්** ලියා දක්වන්න.

(iii) ලක් සසුන තුළ කිතු දහම වෙනුවෙන් ඔබට කළ හැකි සේවාවන් **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන ශුද්ධ බයිබලය

(ii) උත්තම පූජක යාච්ඤාවේ ජේසුස් වහන්සේ තමන් වෙනුවෙන් කළ යාච්ඤාවේ අඩංගු කරුණු

(iii) නික්මයාම තුළ දිව්‍ය සංරක්ෂණය

(iv) ''යුද්ධය පිටු දැක සාමයේ අවි වෙමු අපි''

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2022 (2023)
# කතෝලික ධර්මය I
# පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 - | 03 | 11 - | 03 | 21 - | 02 | 31 - | 02 |
| 2 - | 04 | 12 - | 02 | 22 - | 03 | 32 - | 03 |
| 3 - | 01 | 13 - | 01 | 23 - | 04 | 33 - | 02 |
| 4 - | 04 | 14 - | 04 | 24 - | 01 | 34 - | 01 |
| 5 - | 04 | 15 | 03 | 25 | 02 | 35 - | 04 |
| 6 - | 01 | 16 - | 03 | 26 - | 03 | 36 - | 04 |
| 7 - | 02 | 17 - | 02 | 27 - | 04 | 37 - | 02 |
| 8 - | 03 | 18 - | 02 | 28 - | 01 | 38 - | 03 |
| 9 - | 02 | 19 - | 04 | 29 - | 02 | 39 - | 04 |
| 10 - | 01 | 20 - | 03 | 30 - | 03 | 40 - | 03 |

# කතෝලික ධර්මය - II

1.

(i) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ දෙකක් ලියන්න.

• ද්විත්ව වාදය. • යුගාන්ත වාදය. • සංකේත භාවිතය. • ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම.

(ii) පෙන්තකොස්ත දිනයේ දී ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් තුළ ඇති වූ ප්‍රබල වෙනස්කම් **දෙකක්** ලියන්න.

• අන්‍ය භාෂා කථා කිරීම. • ප්‍රබල ව ජීවිත වෙනස් වීම. • එඩිතර ව දේව වචනයේ සාක්ෂිකරුවන් වීම.

(iii) ශුද්ධ වූ පාවුලු තුමා තම දෙවන ධර්මදූත ගමනේ දී දේශනා කළ නගර **දෙකක්** නම් කරන්න.

•සිරියාවේ අන්තියෝකිය. • තාර්සස් • දර්බය • ලුස්ත්‍රාව• ඉකෝනිය. • පිසිදියේ අන්තියෝකිය

• ත්‍රෝවසය • පිලිප්පිය • තෙසලෝනිකය • කොරින්තිය • බෙරෙයාව • එපීසය •ජෙරුසලම

• ඇතැන්ස්

(iv) ශුද්ධ වූ සභාව ශුද්ධ වූ ත්‍රිත්වයට සම්බන්ධ වන ආකාරය කරුණු **දෙකකින්** දක්වන්න.

- එය ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇත.
- ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් මෙහෙයවන සේක.
- එය දෙවියන් වහන්සේ විසින් තෝරා ගත් ජනතාවකි.

(v) දෙවියන් වහන්සේ විසින් තම ස්වරූපය හා සමානත්වය අනුව මිනිසා මවා ඔවුනට ආසිරි පතමින් කළ ප්‍රකාශයේ අඩංගු කරුණු **දෙකක්** ලියන්න.

• දරු සම්පත් ලැබීම. • වැඩි වර්ධනය වීම. • පොළොව පුරා පැතිරයාම. • පොළොව යටත් කර ගැනීම. • මුහුදේ මසුන් කෙරෙහි බලය පැවැත්වීම. • අහසේ පක්ෂීන් කෙරෙහි බලය පැවැත්වීම. • පොළොවේ සැරි සරන සියලු සතුන් කෙරෙහි බලය පැවැත්වීම.

(vi) ඊශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසර රජතුමා අනුගමනය කළ පියවර **දෙකක්** ලියන්න.

• බර වැඩ ගැනීම • උපදින විට පිරිමි දරුවන් මරාදැමීම • පිරිමි දරුවන් නයිල් ගඟට විසිකිරීමට අණ දීම

(vii) ජේසුස් වහන්සේගේ බෞතීස්ම අවස්ථාවේ දී අහසින් නික්මුණ හඬින් ප්‍රකාශ වූයේ කුමක් ද?

- "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි ".

(viii) කිතුනු විවාහයේ පරමාර්ථයන් වන අනෝන්‍ය සහයෝගය හා ප්‍රේමය තුළ පරිපූර්ණත්වයට පත්වීම සම්බන්ධ කරුණු **දෙකක්** ලියා දක්වන්න.

- ජීවිතාන්තය දක්වාම පවත්වාගෙන යන සම්බන්ධතාවය
- සබඳතාවය ගොඩනගා ගන්නේ දෙදෙනා එකිනෙකා මත දක්වන ආදරය මගිනි.
- ආදරය දිනෙන් දින වර්ධනය කර ගත යුතුයි.

(ix) කිසියම් පුද්ගලයෙකුගේ ආධ්‍යාත්මික යහපත සඳහා කළ හැකි පුණ්‍ය ක්‍රියා **දෙකක්** ලියන්න.

- පව්කරුවන් පාපයෙන් හරවා ගැනීම
- අඥානයන්ට ඉගැන්වීම

- සැක ඇති අයට දැනුමැතිකම් දීම
- දුකින් පෙළෙන්නන් සැනසීම
- නින්දා අපහාස ඉවසීමෙන් දරා ගැනීම
- වැරදි කමා කිරීම
- ජීවතුන් හා මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම

(x) ශුද්ධ වූ මතෙව් සුබාරංචියට අනුව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල අඩංගු සාමය ගොඩනැගීමට අවශ්‍ය කරුණු **දෙකක්** ලියන්න.

- ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න
- ඔබට පිඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.

2. (i) ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ දී එම ප්‍රදේශවල ජීවත් වූ කතෝලිකයන්ට එල්ල වූ බාධා **දෙකක්** ලියන්න.

- කතෝලික පියවරුන් රටින් පිටුවහල් කිරීම.
- අප්‍රසිද්ධියේ වුව ද කතෝලික දහම ඇදහීම තහනම් වීම.
- දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් වීම.
- කතෝලික දෙව්මැදුරු, පාසල් හා පුණ්‍යායතන රෙපරමාදු පූජකයින්ට පවරා දීම.
- රෙපරමාදු දහම පමණක් පාසල්වල ඉගැන්වීම.
- ලන්දේසි පාසල්වලට දරුවන් නොයවන, දරුවන්ගේ දෙමව්පියන්ට දඩ නියම කිරීම.
- රෙපරමාදු දේවස්ථානවල සිදු කරනු නොලබන විවාහ හා බෞතීස්ම පිළිනොගැනීම.
- කතෝලික වත්පිළිවෙත් කිසිවක් සිදු නොවීම

(ii) බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරටට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකාය **තුනක්** නම් කරන්න.

• සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය. • නිර්මල මරිය නිකාය. • ජේසු නිකාය. • ද ලාසාල් සොහොයුරන්ගේ පැවිදි නිකාය. • මාරිස්ට් සොහොයුරන්ගේ පැවිදි නිකාය. • ශුද්ධ වූ පවුලේ කන්‍යා සොයුරියන්ගේ පැවිදි නිකාය. • යහපත් එඬේරා කන්‍යා සොයුරියන්ගේ පැවිදි නිකාය. • ප්‍රැන්සිස්කාන කන්‍යා සොයුරියන්ගේ පැවිදි නිකාය. • දිළිඳුන්ගේ කුඩා සොයුරියන්ගේ පැවිදි නිකාය.

(iii) පාසල් සිසුන් අතර සුබාරංචිය පතළ කිරීමට ඔබට දායක විය හැකි ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

• ආදර්ශමත් ජීවිතයක් ගත කිරීම. • වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීම. • කිතු සමිඳුන් ගැන අන් අයට කියා දීම. • මිනිස් වටිනාකම් ප්‍රධාන කොට සැලකීම. • අවංක වීම. • උදෑසන පාසල් යැදුම සඳහා දේව වචනය එක් කර ගැනීම. • බයිබල් දැනුම මිනුම වැනි තරග සඳහා සිසුන්ව උනන්දු කරවීම. • පාසල් පරිශ්‍රයේ විවිධ ස්ථානවල දේව වචනය ප්‍රදර්ශනය කිරීම. • දැන්වීම පුවරු හා පන්ති කාමරයේ, දිනයට නියමිත දේව වචනය ප්‍රදර්ශනය කිරීම. • සමාජ මාධ්‍යය ඔස්සේ දේව වචනය බෙදා හැරීම.

3. (i) දරුවන් කෙරෙහි දෙමව්පියන්ගේ යුතුකම් **දෙකක්** ලියන්න.

• දරුවන්ට ප්‍රේම කිරීම. • දරුවන් ආරක්ෂා කිරීම. • දරුවන් ගුණ ගරුක ලෙස ඇති දැඩි කිරීම.
• බුද්ධිමත් දරුවන් ලෙස ඇති දැඩි කිරීම. • විනයෙන් හා අවවාදයෙන් ඇතිදැඩි කිරීම

(ii) දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ යුතුකම් **තුනක්** ලියන්න.

- දෙමව්පියන්ට ගරු කිරීම. • ඔවුන්ට කීකරු වීම. • ඔවුන්ට ගරු බිය දැක්වීම. • ඔවුන්ගේ ප්‍රාර්ථනා, අවවාද, කැමැත්ත හා දනමුතුකම් පිළිපැදීම. • මහළු අවධියේ දී ඔවුන් රැකබලා ගැනීම. • රෝගි අවස්ථාවේ දී ඇප උපස්ථාන කිරීම.

(iii) මිතුරන් වෙනුවෙන් ඔබේ යුතුකම් ඉටු කළ අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- තම ජීවිතාදර්ශය ප්‍රධාන කොට සැලකීම. • ඔවුනට නිවැරදි දේ පෙන්වා දීම. • දුක් වන අවස්ථාවල දී ඔවුන් සැනසීම. • විවිධ අවශ්‍යතාවල දී උපකාර කිරීම. • අවශ්‍ය සැමවිට දී දිරිමත් කිරීම. • තනි වූ අවස්ථාවල දී ඔවුන් සමග සිටීම. • ඉගෙනීමේ කටයුතු සඳහා උදව් කිරීම • අවශ්‍ය නම් උපදේශන සේවා සඳහා යොමු කිරීම • තමා තුළින් අන් අයට ක්‍රිස්තුන් වහන්සේව පිළිබිඹු කිරීම • දෙමාපිය ආදරය අහිමි කෙනෙත් නම් කොන් නොකිරීම

4. (i) 'ලිටුර්ජියා' (ජන වන්දනා) යන ග්‍රීක වචනය සෑදී ඇති 'ලාඕස්' සහ 'එර්ගොන්' යන වචන **දෙකකෙහි** අර්ථය ලියන්න.

- ලාඕස් යනු ජනතාවයි. • එර්ගොන් යනු වැටුපක් නොලබා කරන සේවයකි, ප්‍රසිද්ධ වැඩකි.

(ii) චතාරික සමය අර්ථකථනය කරන ආකාර **තුනක්** ලියන්න.

- ප්‍රසිද්ධ ජීවිතය අරඹන්නට පෙර ජේසුස් වහන්සේ පාළුකරයේ ගත කළ යාච්ඤාවේ හා මර්ධනාවේ ජීවිතයට සමවැදෙන කාලයකි.
- පසුතැවිල්ලේ, ආත්ම පරිත්‍යාගයේ හා ජීවිත වෙනසක් ඇති කර ගැනීමේ කාලය යි.
- අපගේ ප්‍රසාද ස්නාපනීය ජීවිතය නවතාවයකට පත් කරන කාලය යි.
- පාපයට මැරී නව ජීවිතයකට උපත ලැබීමේ කාලය යි.
- ලෞකික ආශාවන්ට හා ආත්මාර්ථයට මැරී දෙවිඳුන් තුළ නිදහස් දරුවන් මෙන් ජීවත් වීමේ කාලයයි.
- ජේසුස් වහන්සේගේ දුක් විඳීම සිහිපත් කරන කාලයකි

(iii) පාසල් සිසුවෙකු වශයෙන් ඔබ මීසම තුළ චතාරික සමය අර්ථවත් කර ගැනීමට ඔබට කළ හැකි දෑ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- පන්තියේ මිතුරන් හා එක්ව චතාරික ජනවන්දනා වැඩසටහන් වලට සහභාගි වීම.
- ඔවුන් සමග එක්ව චතාරික පරිත්‍යාගයක් කිරීම.
- ඔවුන් සමග එක්ව වන්දනා ස්ථානයකට යාම.
- චතාරික ව්‍යාපෘතියක් සූදානම් කිරීම.
- පන්තියේ යහළුවන් ලෙස ඉදිරියේ දී කළ හැකි ක්‍රියා සංවිධානය කිරීම.
- සැම දිනම දෙවිඳුන්ට ස්තුති කළ යුතු කාරණා ලැයිස්තුවක් සැකසීම.
- ඔබේ පාසල වෙනුවෙන් විශේෂ සේවාවක යෙදීම.
- පසන් ගායනා පැවැත්වීම.
- පියතුමා දැනුවත් කර රෝගීන් සඳහා සමගි සන්ධානය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා දීමට කටයුතු කිරීම.
- ආත්මීක මල් පොකුර සෑදීමට බාල සහෝදර සහෝදරියන් යොමුකරවීම.

5. (i) ජේසුස් වහන්සේගේ දූත සේවාවේ දී රෝගීන් සුවපත් කළ අවස්ථා **දෙකක්** නම් කරන්න.

- අංශභාග රෝගියා සුව කිරීම.
- අතක් පණ නැති මිනිසා සුව කිරීම.
- සළුවට අත ගැසූ ස්ත්‍රියට සුවය
- අන්ධයින්ට සුවය
- ලාදුරු රෝගීන් සුව කිරීම

(ii) රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද **තුනක්** ලියන්න.

- පෞද්ගලිකව තමන්ගේත් මුළු ශුද්ධ වූ සභාවේත් යහපත වෙනුවෙන් රෝගී වූ පුද්ගලයා ක්‍රිස්තුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියට සම්බන්ධ කිරීම.
- රෝගී බවෙන් හෝ වයස්ගත වීමෙන් ඇතිවන වේදනා ක්‍රිස්තියානි ලීලාවෙන් දරා ගැනීමට ශක්තිය,
  සාමය හා ධෛර්යය ලැබීම.
- පාපවලට ක්ෂමාව ලබාගැනීමට අවස්ථාව ලැබීම.
- රෝගියාට ඔහුගේ පව්වලට සමාව ලැබීම
- ආත්ම ගැලවීමට ගෝචර වන්නේ නම් ශාරිරික සුවය ලැබීම.
- සදාකාලික ජීවිතය කරා එතෙරවීමට සූදානම් කිරීම.
- රෝගී වූ අයගේ විශ්වාසය හා බලාපොරොත්තුව පෝෂණය කරමින් ජීවිතයේ පෙරට යාමට දිරිය ලබා
  දීම.

(iii) රෝගී තත්ත්වයෙන් සමාජයේ අසරණව සිටින අය වෙනුවෙන් ඔබට කළ හැකි යහපත් ක්‍රියා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- රෝගී තත්ත්වයෙන් මුදවා ගැනීමට අවශ්‍ය ජේසුස් වහන්සේගේ ආශීර්වාදය ලැබෙන ලෙස ඔවුන් සමඟ
  එකතුවී යාච්ඤා කිරීම.
- රෝගී තත්ත්වයෙන් මිදීමට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ඔවුන්ට මගපෙන්වීම හා ඔවුන්ව
  රෝහල්වලට රැගෙන යාමට වැඩිහිටියන් සමඟ එකතු වී කටයුතු කිරීම.
- ශාරිරික හා මානසික සුවය ලබාදීම සඳහා නොයෙක් වැඩ සටහන්වලට යොමු කිරීම.
  උදා: වෛද්‍ය සායන, විනෝද වැඩ සටහන්
- ගිලන්වී සිටින අයට ඇප උපස්ථාන කිරීම.
- මහළු නිවාසවල සිටින අය වෙනුවෙන් සේවාවන් කිරීම
  උදා: රෙදි පිළි ශුද්ධ පවිත්‍ර කිරීම, ඔවුන්ව පිරිසිදු කිරීම
- රෝගී අය සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට පියවර ගැනීම.
  උදා: පිළිකා රෝගීන්, හෘද රෝගීන්, දියාවැඩියා රෝගීන්
- ඔවුන්ට සංවේදී වී ඇහුම්කන් දීම හා අවශ්‍ය සක්‍රමේන්තු ලබා දීමට කටයුතු කිරීම

6. (i) දෙවන මැවීමේ කථාවේ දී දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් සඳහා යොදා ඇති හෙබ්‍රෙව් වචන සහ ඒවාහි අර්ථයන් ලියා දක්වන්න.

වගාකිරීම = "අබාද්" අර්ථය - වැඩ කරමින් නිර්මාණය කිරීම

රැකබලා ගැනීම = "ෂාමාර්" අර්ථය - සංරක්ෂණය කිරීම

(ii) ඇතුළාන්ත සාමයට මූලික වන කරුණු **තුනක්** ලියා දක්වන්න.

- සත්‍යය • යුක්තිය • ප්‍රේමය • නිදහස • අන් අයට හා ඔවුන්ගේ අයිතිවාසිකම් වලට ගරු කිරීම
- යුද්ධය හා ප්‍රචණ්ඩ ක්‍රියා නොමැතිවීම

(iii) ලක් සසුන තුළ කිතු දහම වෙනුවෙන් ඔබට කළ හැකි සේවාවන් **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- දේව වචනය ජනතාව අතරට ගෙනයාම.
- වර්තමානයේ ප්‍රසිද්ධ ජනමාධ්‍ය හරහා ද (මුහුණු පොත වැනි) සඟරා, ලිපි මෙන්ම පුවත්පත් හරහා ද හැකි අයුරින් දේව වචනය ජනතාව අතරට ගෙනයා යුතුයි.
- බිඳුණු සහා සමගිය වෙනුවෙන් මැදිහත් වී ක්‍රියාකිරීම.
- අනෙක් සහෝදර ආගම් සමඟ ධර්ම විවේක හා භාවනා වැඩසටහන් පවත්වමින් ද, විවිධ පොදු වැඩවලට ඒකරාශී වෙමින් ද ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩ කටයුතු කිරීම.
- සමිඳු මිදි උයනේ උන්නතියට දායකවීම.
- සමිඳු මිදි උයනේ උන්නතිය වෙනුවෙන් පූජක පුතුන්වීමට දරුවන් දිරි ගැන්වීම හා ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට ආධාර සැපයීම මෙන්ම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුවලට උදව් උපකාර කිරීම.
- තරුණ තරුණියන් ලෙස මීසමේ වැඩ කටයුතුවලට ක්‍රියාකාරීව දායකවීම.
- වත්මන් සමාජයේ වැඩිහිටියන් පමණක් දේවස්ථානයට යොමුවී සිටින යුගයක ඉදිරි අනාගතය භාරගැනීමට සිටින අප ක්‍රියාකාරී ලෙස දේවස්ථානයේ විවිධ සමිති සමාගම්වලට බැඳී ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස කටයුතු කිරීම.
- අන් අයට ආදර්ශයක් වන අයුරින් කටයුතු කිරීම හා දෙවිඳුන් යැදීම.
- තම පල්ලියේ, ගමේ හා පාසලේ දී දෙවිඳුන්ට හා අන් අයට ප්‍රියමනාප අයුරින් කටයුතු කිරීම හා ජේසුස් වහන්සේ අනුව යමින් ආදර්ශවත් දිවියක් ගතකිරීම
- ජනවන්දනාවට දේශීය වත් පිළිවෙත් මුසුකිරීම.
- දෙවි පියාණන්ගෙන් ඈත්වී නොමඟ ගිය අයට නිවැරදි මඟ පෙන්වීම.

- දේව විශ්වාසය පළුදු වූ අයව ද සාන්ත සභාවෙන් බැහැර ගිය අයව ද නැවත කැඳවාගෙන සැබෑ මනස්ථාපයකින් (පාපොච්චාරණය කර) යුතුව දේව ප්‍රසාද නිධාන ලබාගැනීමට ඔවුන්ට මඟපෙන්වමින් ඔවුන්ගේ අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කිරීමට දායකවීම.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන ශුද්ධ බයිබලය

● අති පූජනීය ග්‍රන්ථයකි. ● පොත් සමූහයකි. ● පුස්තකාලයකි. ● සභා සම්මතය අනුව කතෝලික බයිබලයේ පොත් 73 කි. වෙනත් සභා අනුව පොත් සංඛ්‍යාව වෙනස් වේ. ● දේවානුභාවයෙන් ලියවී ඇත. ● ප්‍රධාන කර්තෘ දෙවියන් වහන්සේ ය. ● උපකාරක කර්තෘ මිනිසා ය. ● ක්‍රි. පූ. 950 හා ක්‍රි. ව. 100 අතර ලියවී ඇත. ● පුරාණ ගිවිසුම හා නව ගිවිසුම ලෙස කොටස් දෙකකි.

(ii) උත්තම පූජක යාච්ඤාවේ ජේසුස් වහන්සේ තමන් වෙනුවෙන් කළ යාච්ඤාවේ අඩංගු කරුණු

- පුත්‍රයාණන් වහන්සේව මහිමයට පමුණුවන ලෙස යාච්ඤා කරයි.
- පුත්‍රයාණන් විසින් පියාණන් වහන්සේව මහිමයට පමුණුවන සේක.
- එතුමාණන් විසින් පුත්‍රයාණන් වහන්සේට දෙන ලද සියල්ලන් හට සදාතන ජීවනය දෙන පිණිස යාච්ඤා කරයි.
- සකල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ආධිපත්‍යය ඔබ වහන්සේ පුත්‍රයාණන් වහන්සේට දුන් සේක.
- සදාතන ජීවනය නම් එකම සැබෑ දෙවියන් වන ඔබ ද ඔබ විසින් එවන ලද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ද දැනගැනීමය.
- ඔබ වහන්සේ මට බාර දුන් මෙහෙය ඉටු කර ඇත.
- එමගින් ඔබ මහිමයට පැමිණවීමි.
- දැන් ඔබ ඉදිරියෙහි මා තේජශ්‍රීයට පැමිණෙව්ව මැනව.

(iii) නික්මයාම තුළ දිව්‍ය සංරක්ෂණය

- දිව්‍ය සංරක්ෂණය යනු දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දක්වන ආදරය හා රැකවරණයයි.
- නික්මයාම ගමන තුළ මිනිසාට දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය විදහාපෑමට ස්වභාව ධර්මය උපයෝගි කරගත් සේක
- රතු මුහුද තරණය කිරීමට අවස්ථාව සලසාදීම.
- මස්සා හා මෙරීබා ස්ථානවලදී පර්වතවලින් ජලය ලබාදීම.
- මාරා නම් ස්ථානයේදී කරදිය, බීමට සුදුසු ජලය බවට පත් කිරීම.
- ආහාර සඳහා වටු කුරුල්ලන් හා මන්නා ලබාදීම.
- දහවල් කාලයේදී වළාකුළක් සේ ද, රාත්‍රී කාලයේ දී ගිනි ටැඹක් සේ ද, මගපෙන්වීම හා ආරක්‍ෂාව සැලැස්වීම.
- දේව ජනතාව වහල් බවින් මුදවා පොරොන්දු දේශය දක්වා යන ගමන තුළදී දිව්‍ය සංරක්‍ෂණය අත්දැකීම දේව ආදරය හා රැකවරණයට උදාහරණ වේ.

(iv) ''යුද්ධය පිටු දැක සාමයේ අවි වෙමු අපි''

- මිනිසකු ලෙස හා ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරන සැබෑ කතෝලිකයෙකු ලෙස තමන්ගේ සිත
  හා මනස සන්සුන්ව තබා ගත යුතුය. එය මිනිස් බවට කරන වටිනා ගරුත්වයකි.
- යහපත් ගතිගුණවලින් පිරුණු ජීවිතයක් ගතකිරීම තුළ අප සාමකාමී පුද්ගලයන් බවට පත්වේ.
- මිනිසා සාමකාමී නොවන විට දී තමන් බලවත් යැයි සිතීම, අනුන් හෙළා දැකීම එකිනෙකා අතර
  ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමට සිත යොමුවීම වැනි දේවල් නිසා මිනිසාට මිනිසා එරෙහිව නැගී සිටියි.
- එවැනි අවස්ථාවලදී ගැටුම්, මිනිස් ඝාතන, යුද්ධ ආරවුල් ආදිය දැකගත හැකිවේ. ඒවා මිනිස් ජීවිත
  විනාශ කිරිමට මඟ පාදයි.
- එසේනම් සාමය ගොඩනැගීමට අප නිතර වෙහෙස විය යුතුවෙමු.
- සාමයේ අවියක් වීමට,
  - මිනිසාට මිනිසා ගරු කළ යුතුවේ.
  - මිනිස් අයිතිවාසිකම් සුරැකිය යුතුවේ.
  - ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කළ යුතුවේ.
  - සාධාරණත්වය හා දයාව සිත් තුළ ජනිත කර ගත යුතුවේ.
- සාමයේ කුමාරයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත්වීමෙන් ඇතුළාන්ත සාමය අත්දැකිය හැක.
- වෛරය පිරුණු තැනට ප්‍රේමය ද, අසමගි තැනට සාමය ද පතුරුවමින් සාමයේ අවියක් වීමට ක්‍රියා කරමු.